# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 24 දරන
# විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය**

**මිල : ශත 30 යි.** **තැපැල් ගාස්තුව : ශත 75 යි.**

**1988 අංක 24 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 31/88

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 24 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25අ වන වගන්තියේ " උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් මේ පනතේ 21 වන, 22 වන, 23 වන, 24 වන, 24අ සහ 25 වන වගන්තිවල සඳහන් ආයතනයක් නොවන යම් ආයතනයක් " යන වචන සහ ඉලක්කම් වෙනුවට, " උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් යම් ආයතනයක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1978 අංක 16 දරන පනතේ 25අ වන **වගන්තිය** සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 70ඇ වන වගන්තියේ, (1) වන උපවගන්තියේ " ඒ ආයතනයේ සලස්වන ලද අධ්‍යාපන පහසුකම් ද ඇතුළුව ඒ ආයතනයට අදාළ වාර්තාවක් " යන වචන වෙනුවට " ඒ ආයතනයේ සපයනු ලබන අධ්‍යාපන පහසුකම් ද ඇතුළුව ඒ ආයතනයට අදාළ වාර්තාවක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ " උපාධි ප්‍රදාන ආයතනය " යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

" උපාධි ප්‍රදාන ආයතනය " යන්නෙන් 25අ වන වගන්තියේ විධිවිධාන යටතේ පිළිගනු ලැබූ යම් ආයතනයක් අදහස් වේ ; '.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.